ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පරීක්ෂණය (භූගෝල විද්‍යාව) - පළමු භාගය

දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2017

# GYG 2230 - තුන්වන ලෝකයේ නාගරීකරණය

පැ දෙකයි (02)

ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1. වර්තමාන ලෝකයේ ඉහළම නාගරීකරණ ප්‍රතිශතයක් සහිත කලාපය ලතින් ඇමරිකානු කලාපය වේ.

   (i) ලතින් ඇමරිකානු කලාපය තුළ නාගරීකරණය ආශ්‍රිතව උද්ගතවී ඇති ගැටලු නිදසුන් සහිතව විමසන්න.

   (ලකුණු 10)

   (ii) ලතින් ඇමරිකානු කලාපයේ නාගරික ප්‍රතිපත්ති සකස් කිරීමේදී අවධානයට ලක්විය යුතු කරුණු සාකච්ජා කරන්න.

   (ලකුණු 10)

2. (i) සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරික ප්‍රදේශ ආශ්‍රිත සමාජයීය ගැටලු කෙටියෙන් සඳහන් කරන්න.

   (ලකුණු 05)

   (ii) නාගරික අනවසර ඉදිකිරීම් සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරික ජන ජීවිතයට සිදුකරන බලපෑම නිදසුන් සහිතව සාකච්ජා කරන්න.

   (ලකුණු 15)

3. නාගරීකරණය හේතුවෙන් නාගරික උපද්‍රව සිදුවීමේ ප්‍රවණතාව වර්තමානය වන විට ඉහළ ගොස් ඇත.

   (i) තුන්වන ලෝකයේ රටවල නාගරික උපද්‍රව ආශ්‍රිත මෑතකාලීන ප්‍රවනතා කෙටියෙන් විස්තර කරන්න.

   (ලකුණු 05)

   (ii) (ii) තුන්වන ලෝකයේ රටවල් ආශ්‍රිත නාගරීකරණ උපද්‍රව තීව්‍රවීම කෙරෙහි බලපා ඇති සාධක නිදසුන් සහිතව විමසන්න.

   (ලකුණු 15)

4.

(i) තෙවන ලොව රටවල නාගරීකරණ ක්‍රියාවලිය ආශ්‍රිත විශේෂිත ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

(ii) ඉහත ඔබ සඳහන් කළ ලක්ෂණ එම රටවල නගර නිර්වචනය කිරීමේදී වැදගත් වන ආකාරය නිදසුන් ඇසුරින් විමසන්න.

(ලකුණු 15)

5. අග්‍ර නාගරීකරණය, සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ඇසුරෙන් හඳුනාගත හැකි ක්‍රියාවලියකි.

i. අග්‍ර නාගරීකරණය මිනුම් කිරීම සඳහා යොදාගනු ලබන ක්‍රමවේද දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ii අග්‍ර නාගරීකරණය ඇතිවීම කෙරෙහි බලපානු ලබන සාධක නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

6.

(i) නාගරික භූමි පරිභෝග ආකෘතිවල පොදු ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

(ii) තුන්වන ලෝකයේ නගර ආශ්‍රිත සමාජ ආර්ථික රටාව හඳුනා ගැනීම සඳහා නාගරික භූමි පරිභෝග ආකෘති ඉවහල් කර ගත හැකි ආකාරය ආසියාව <u>හෝ</u> අප්‍රිකාව ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15)

0000000000